**ජාතික ආරක්ෂක අරමුදල - 2021**
**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

ජාතික ආරක්ෂක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල අරමුදල විසින් විරුසිසු ප්‍රදීප වැඩසටහන යටතේ 2019 වර්ෂයේ පහ වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් 136 දෙනෙකු වෙත රු.25,000 බැගින් වූ ඉතිරිකිරිමේ තැන්පතු ගිණුම් අරඹා තිබුණු අතර මේ සඳහා වාණිජ බැංකුවක් විසින් එක් සිසුවකු සඳහා රු.10,000 බැගින් රු.1,360,000 ක දායකත්වයක් දක්වා ඇතත් මෙම පරිත්‍යාගය පිළිබඳව ගිණුම් මගින් අනාවරණය කර නොතිබුණි. | ඩී.එෆ්.සී.සී. බැංකුව විසින් සෘජුවම ශිෂ්‍යත්වලාභීන් සඳහා බැංකු ගිණුම් විවෘත කොට මුදල් තැන්පත් කල බැවින් එම මුදල් අරමුදල වෙත ලැබීම හෝ අරමුදල වෙතින් ගෙවීමක් සිදු වී නොමැත. ඒ අනුව ගිණුම් වලින් ඒ බව නිරූපණය නොවේ. කෙසේ වුවද මෙවැනි පරිත්‍යාග ඉදිරියේදී සටහනක් මාර්ගයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමට සටහන් තබා ගන්නා ලදී. | පරිත්‍යාග පිළිබඳව ගිණුම් මගින් අනාවරණය කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | නිවාස ව්‍යාපෘති පරිපාලන වියදම් | 2,849,687 | අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙත් සෙවන අර්ධ නිවාස ආධාර ව්‍යාපෘතියේ පරිපාලන | ව්‍යාපෘතියට අදාළව ත්‍රිවිධ හමුදාව හා ශ්‍රී ලංකා පොලීසිය මගින් කරනු ලබන ඉන්ධන, වාහන කුලී හා ලිපි | දරන ලද සත්‍ය පරිපාලන වියදම් හඳුනාගැනීම හා වාර්තා කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | වියදම් ලෙස නිවාස ආධාර මුදලින් සියයට 01 ක් හෙවත් රු.2,849,687 ක් සමාලෝචිත වර්ෂය තුල ත්‍රිවිධ හමුදාව හා පොලිසියේ ගිණුම් වෙත මුදාහැර ඇතත් එම මුදලින් වර්ෂය තුල දරන ලද තථ්‍ය වියදම හෝ වියදමේ ස්වභාවය අනාවරණය කර නොතිබුණි. | ද්‍රව්‍ය ආදී වියදම් සඳහා පරිපාලන වියදම් ලබාදීමට පාලක මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. ඒ ඒ හමුදාවන් වෙත ඉදිරියේදී දෙනු ලබන පරිපාලන වියදමින්, දරනු ලැබූ වියදම්, වාර්තාවක් මගින් ගෙන්වා ගැනීමට සටහන් තබා ගන්නා ලදී. | කල යුතුය. |
| (ආ) | නිවාස ආධාර වාරික ගෙවීම. | 68,192,020 | අරමුදල විසින් තෝරාගත් ප්‍රතිලාභින් 288 ක් වෙත මුදාහැරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. 68,192,020 ක මුදලක් ත්‍රිවිධ හමුදාව හා පොලිසියේ ගිණුම් වෙත මුදාහැර ඇතත් එම මුදල් අදාල කාලසීමාව තුළ ප්‍රතිලාභින් වෙත ගෙවූ බවට සනාථ වන ලියවිලි විගණනයට ඉදිරිපත් නොවුණි. | අරමුදලේ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති බව ඇගැයීම් පත්‍ර මගින් තොරතුරු ලබා ගත හැකි වන අතර මූල්‍ය ප්‍රතිපාදන ප්‍රතිලාභීන් වෙත නිසියාකාරව ගෙවූ බවට සනාථ කෙරෙන ලේඛනයක් ඒ ඒ හමුදාව මගින් ඉදිරියේදී ගෙන්වා ගැනීම සඳහා කටයුතු කෙරේ. | ගෙවනු ලබන ආධාර මුදල් ලැබුණු බවට අදාල ප්‍රතිලාභීන් මගින් තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හා චක්‍රලේඛ මාර්ගෝපදේශ අංක 04 . | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තාවක් සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු | අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තාව නියමිත පරිදි ඉදිරියේදී ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හා චක්‍රලේඛ මාර්ගෝපදේශ 04 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වුවද 2021 වර්ෂය සඳහා එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | මුදල් රෙගුලාසි 756 | අරමුදලට අයත් තක්සේරු වටිනාකම රු. 2,890,415 ක් වූ මැනික් ඔබ්බවන ලද ඇත් දල ඔටු රූපය ජනාධිපති කාර්යාලයේ පවතින බවට දක්වා ඇතත් එය වාර්ෂික සත්‍යාපනයට ලක්කර නොතිබුණි. | මැණික් ඔබ්බවන ලද ඇත් දල ඔටු රූපය ජනාධිපති ලේකම් කාර්යාලයේ පවතින බවට තහවුරුවක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වාර්ෂිකව ලබා ගැනීමටත් සත්‍යාපනය කිරීමට කටයුතු කිරීමටත් සටහන් කර ගන්නා ලදී. | මු.රෙ.756 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 51001 දරන ජංගම ගිණුමෙහි 2021 වර්ෂය තුළ රු. 3,910,317 ක සාමාන්‍ය මාසික ශේෂයක් පවත්වාගෙන පැවති අතර රු. මිලියන 10 ඉක්ම වූ ශේෂයක් මාස 03 කට අධික කාලයක් අඛණ්ඩව පවත්වාගෙන තිබුණි. එම අතිරික්ත මුදල් ඵලදායී ආයෝජන අවස්ථාවක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ජාතික ආරක්ෂක අරමුදලේ ජංගම ගිණුම් ශේෂයේ ඇති අතිරික්ත මුදල් ඵලදායීව ආයෝජනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. | අරමුදලේ සැලැසුම් ගත කාර්යයන් සඳහා මුදල් අවශ්‍යතාව තීරණය කර අතිරික්ත මුදල් ආයෝජනයකල යුතුය. |

## 1.8 ආයෝජන කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අරමුදලට අයත් ස්ථාවර තැන්පතු දෙකක් කල්පිරීමෙන් දින 45 සිට දින 37 ක් දක්වා ප්‍රමාදවී ප්‍රති ආයෝජනය කිරීම හේතුවෙන් අරමුදලට අහිමි වී තිබුණු ඇස්තමේන්තුගත අවම පොලී අදායම රු.3,494,141 ක් බව නිරීක්ෂණය වීය. | අමාත්‍යාංශයේ විෂය පථය සංශෝධනය වීම, නව කාර්ය මණ්ඩලයක් යටතේ අරමුදලේ කටයුතු සිදුකිරීම හා බැංකු කටයුතු සඳහා කාර්ය මණ්ඩලය යලි ලියාපදිංචි කළයුතුවීම ආදිය හේතුවෙන් ස්ථාවර තැන්පතු ප්‍රති ආයෝජනය කිරීම පමා විය. ඉදිරියේ දී ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කෙරේ. | නිශ්චිත පූර්ව සැලසුමකට අනුව ආර්ථිකභාවයෙන් යුතුව ආයෝජන සිදුකර ප්‍රසස්ථ ආයෝජන ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 34,987,345 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.79,023,742 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 44,036,397 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට "මෙත් සෙවණ" නිවාස ප්‍රතිලාභ ගෙවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 56 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙත්සෙවණ ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය සඳහා රණවිරු ප්‍රතිලාභීන් 150 ක් සඳහා රු.105,980,000 ක් ගෙවා අවසන් කිරීමට සැළසුම් කළද 2021 වර්ෂය තුල කිසිදු වාරික මුදලක් ගෙවීමට අරමුදල අපොහොසත් වී තිබුණි. | 2020 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීමේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් 2021 වර්ෂයේ අර්ධ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | මියගිය හා අබාධිත රණවිරුවන්ගේ 2019 වර්ෂයේ පහවසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් 137 ක් සඳහා රු.25,000 බැගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මාස 15 ආසන්න කාලයක් ප්‍රමාදවී තිබුණු අතර තවද, 2020 වර්ෂයේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දූ දරුවන් 130 කට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ කටයුතු 2021 වර්ෂයේ ජුනි 30 දින වනවිට අවසන් කිරීමට සැළසුම් කර තිබුණද 2022 අප්‍රේල් 25 දින වන විටත් ශිෂ්‍යාධාර ලබාදීමට නොහැකිව තිබුණි. | 2019 වර්ෂයේදී, 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් රණවිරු දූ දරුවන් වෙත ශිෂ්‍යාධාර ලබාදීම රටෙහි පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය තුළ ශිෂ්‍යාධාර ලබාදිය නොහැකි විය. 2020 වර්ෂයට අදාල ශිෂ්‍යත්ව ප්‍රදානය කඩිනමින් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂීක ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව අරමුදලේ 2018 සිට 2020 දක්වා වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ජාතික ආරක්ෂක අරමුදලේ 2018 හා 2019 වර්ෂ අවසාන විගණකාධිපති සම්පිණ්ඩන වාර්තා භාෂා පරිවර්තනය සිදු කිරීමට, යොමු කල අතර භාෂා පරිවර්තනය සිදුවූ සැනින් ඉදිරි පියවර ගන්නා බව කාරුණිකව දන්වමි. | 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**4.3** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(1)(ඇ) වගන්තිය ප්‍රකාරව අරමුදලක පාලක අධිකාරිය විසින් වාර්ෂික අයවැය ලේඛණය අරමුදලේ අරමුණට අනුකූලව පිළියෙලකර නිශ්චිත අනුමැතියන් සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත්කලයුතු වෙතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛණය පාලක මණ්ඩලය අනුමත කර ඇති අතර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2022 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛණය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වා සිටිමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(1)(ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |